# පටුන


**සංස්ථාපිත තොරතුරු....................................................................................** 01

**සභාපතිතුමියගේ පණිවුඩය............................................................................** 02

**පාලන භාරකාරතුමාගේ සමාලෝචනය..........................................................** 03

**දැක්ම..................................................................................................................,** 04

1. **2013 වසරේ අරමුදලෙහි කාර්යසාධනය.......................................................** 05
   - a. 2013 වසරේ ප්‍රතිලාභීන්........................................................................ 05
   - b. ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය........................................... 07
   - c. නිකුත් කල ණය සිමාවන් හා ණය මුදල් වටිනාකම.................................... 08
   - d. ණය අයකරගැනීමේ ප්‍රගතිය................................................................ 08
   - e. අක්‍රිය ණය ගිණුම් කළමණාකරණය........................................................ 09
   - f. කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල.................................. 11
     - i. කුලී ආදායම.................................................................................... 11
     - ii. අරමුදලෙහි තිරසාරභාවය................................................................. 11
     - iii. මෙහෙයුම් ආදායම.......................................................................... 12
   - g. පහසුකාරකයෙකු (Facilitator) වූ ආයතන...............................................12
   - h. දැයට කිරුළ වැඩ සටහන - 2013.......................................................... 12

2. **අරමුදලේ පසුබිම.......................................................................................** 13
   - a. භාරකාර මණ්ඩලය............................................................................... 13
   - b. 2013 වසරේ ආයතනයේ කාර්යය මණ්ඩලය............................................... 13
   - c. සංවිධාන ව්‍යුහය.................................................................................. 14

3. **සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය..........................................**15
   - a. නව බඳවා ගැනීම්................................................................................ 15
   - b. උසස් වීම්...........................................................................................15
   - c. කාර්ය මණ්ඩල සුභසාධනය / සුහද චාරිකාව.............................................. 15
   - d. කාර්ය මණ්ඩල ණය.............................................................................. 15
   - e. ආයතනයේ පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම......................................... 15
   - f. පාවිච්චි කල නොහැකි අබිලි භාණ්ඩ අපහරණය......................................... 15
   - g. ලේඛනාගාරය නවීකරණය කිරීම.............................................................. 16
   - h. ගොඩනැගිලි පරිශ්‍රය වැඩි දියුණු කිරීම.................................................. 16
   - i. විගණන හා කළමණාකරණ කමිටුව......................................................... 16

4. **අනාගත සැලසුම්.......................................................................................** 16

5. **ලෝහෝර් ආර්යා ණය අරමුදල සඳහා ස්වාධීන විගණක වාර්තාව...........................** 17

6. **ආදායම් ප්‍රකාශය........................................................................................** 18

7. **ශේෂපත්‍රය.................................................................................................** 19

8. **මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය..................................................................................** 20

9. **මුල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්............................................................................**21-28

10. **බඳුකරණය කිරීම.........................................................................................** 29

**ආයතනයේ නම ලිපිනය :**

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100/ 3/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

**ලියාපදිංචිය :**

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

**භාරකාර මණ්ඩලය :**

- ගීතා කුමාරි විමලවීර මෙය - සභාපතිනි,(අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)
- නිමල් අබේසිරි මයා - පාලන භාරකාර
- ඩබ්.ඒ.ඩී.ආර්. ගුණවර්ධන මයා - සාමාජික
- කේ.පී. සෝමසුන්දර මයා - සාමාජික
- කේ.ජේ.බී.ඒ. දිසානායක මයා - සාමාජික

**විගණන කමිටුව :**

- ටී.එන්. ඔෂන් මහතා - සභාපති, (අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව)
- ඩබ්.ඒ.ඩී.ආර්. ගුණවර්ධන මයා - සාමාජික
- කේ.පී. සෝමසුන්දර මයා - සාමාජික
- කේ.ජේ.බී.ඒ. දිසානායක මයා - සාමාජික

**විගණක** : ගුණසේකර රත්නායක සහ සමාගම
වරලත් ගණකාධිකාරී,
65/3, ශ්‍රී චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

**සේවාවන් ලබා ගන්නා බැංකුව:** මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

## සභාපතිතුමියගේ පණිවිඩය

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 2013 ගිණුම් වර්ෂයට අදාල වාර්ෂික වර්තාව සතුටින් ඉදිරිපත් කරන අතර ප්‍රතිලාභීන්ට සතුටුදායක සේවාවක් සපයන රාජ්‍ය ආයතනයක් ලෙස සාර්ථකව ක්‍රියාත්මක වන බව කාර්යය සාධනය තුලින් තහවුරු වේ.2013 වසරේ ප්‍රතිලාභීන් 5005 දෙනෙකු අතර රුපියල් මිලියන 194 ක කෙටි කාලින ණය මුදල් සැපයීමට හැකි වූ අතර මෙය 2012 වර්ෂයේ කාර්ය සාධනය සමග සසඳා බලන විට සතුටුදායක ප්‍රගතියකි.

දශක ගණනාවක් තිස්සේ පැවති අක්‍රීය ණය සඳහා විශේෂ කාර්යයන් 2011-2013 කාල පරිච්ඡේදය තුල ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කිරීම අරමුදල් කළමනාකරණයේ විශේෂ අවස්ථාවකි. මෙම කාර්යයන් රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවේ උපදෙස් හා නිර්දේශ අනුගමනය කරමින් සාර්ථකව නිම කිරීමට හැකි විය.

අරමුදලේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය, මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සහ අරමුදල කෙරෙහි ප්‍රතිලාභීන්ගේ විශ්වාසය තහවුරු කිරීම තුලින් භාරකාර මණ්ඩලය විසින් විශේෂ අවධානය යොමුකර ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී. වර්ෂයට අදාල ණය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසු අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීම හා ආයතනයේ සේවකයන් දිරිමත් කිරීම සඳහා ණය සැපයීම, පුහුණු කිරීම් සහ අනෙකුත් සුබ සාධක කටයුතු සඳහා අවධානය යොමු කරන ලදී. ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්යාල පරිශ්‍රයේ ගුණාත්මක භාවය ඉහල නැංවීම තුලින් කාර්යාල පරිසරය වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත.

2013 වසරේ ඉහත අරමුණු සපුරා ගැනීමේදී භාරකාර මණ්ඩල සමාජිකයන්ගෙන් ලැබුනු උපක්‍රමශීලී උපදෙස් සහ සාර්ථක මගපෙන්වීමද කාර්යාල සේවකයින්ගේ නොමසුරු කැපවීම සහ සහයෝගයද කෘතඥ පූර්වකව සිහිපත් කරන අතර අරමුදලේ තිරසාරභාවය පවත්වා ගැනීමට සහයෝගය දැක්වූ සියළු ප්‍රතිලාභීන්ටද මාගේ ගෞරව ස්තූතිය පුදකර සිටිමි.



සභාපතිනිය
ලෝහෝර් ආර්යා ණය අරමුදල

## පාලන භාරකාරතුමාගේ පණිවිඩය

1927 මාර්තු 26 දින ආරම්භ කර ඇති ලෝහෝර් ආර්යා ණය අරමුදල වර්ෂ 80 කට අධික කාලයක් තුල සාර්ථකව ක්‍රියාත්මක වෙමින්, වර්තමානයේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සාර්ථක සේවාවක් ලබාදෙමින් පවතී.

අභ්‍යන්තර පාලන කටයුතු ශක්තිමත් කිරීම මෙන්ම ණය මුදල් ලබා දීමේ සහ ලබා දුන් ණය මුදල් අක්‍රීය නොවී ක්‍රමාණුකූලව ණය අය කර ගැනීමේ ක්‍රමවේදයක් සලසා ණය කළමණාකරනය ශක්තිමත් කිරීමට හැකිවීම 2012 වසරේ සිට මා පාලන භාරකාර ධුරයට පත්වීමෙන් පසු ලැබූ ජයග්‍රහනයකි.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන සංකල්පය අනුව දැයේ සංවර්ධන වැඩ පිළිවෙලට සම්බන්ධ වෙමින් දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක වල සේවකයින් ආවරණය වන අයුරින් මෙම සේවාව ලබා දීමට කටයුතු කිරීමට හැකි වීමද සතුටට කරුණකි.. ඒ සඳහා වාර්ෂිකව පවත්වනු ලබන දැයට කිරුළ සංවර්ධන වැඩසටහන හේතු වී ඇත. දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දුෂ්කර පළාත් වල රාජ්‍ය සේවකයින් හට ණය පහසුකම් ලබාගත හැකිවන සේ අරමුදලේ කටයුතු පුළුල් වී ඇත. ඒ අනුව, 2012 වසරට පෙර කොළඹ දිස්ත්‍රික්කය අවට 75% ක් පමණ වූ ණය ප්‍රතිලාභින්, 2013 වසරේදී කොළඹ දිස්ත්‍රික්කය තුල 14% ක් දක්වා අඩු වී අනෙකුත් දිස්ත්‍රික්ක අතර ප්‍රසාරණය වීම නිදසුනකි. (වගුව - 01).

2013 වසරේ ආයතනය වෙනුවෙන් ඉටු කරනු ලැබූ විශේෂ කාර්යය වූයේ දශක ගණනාවක තිස්සේ ලේඛනාගාරයේ එකතුව තිබූ ලිපිගොනු සහ වාර්තා විධිමත් පරිදි අපහරණය කර දෛනික කාර්යාල කටයුතු විධිමත් කිරීමට හැකිවන පරිදි කළමණාකරනය ශක්තිමත් කිරීමයි. සියළුම පැරණි ලිපිලේඛන ඉවත් කිරීමෙන් පසු පිරිසිදු ප්‍රසන්න පරිසරයක් ඇති කර දීමට හැකි වුවා පමණක් නොව ආයතනයේ මූල්‍ය ප්‍රගතියටද පූර්ණ ශක්තියක් විය. තවද, සේවක සුභසිද්ධිය වැඩිදියුණු කර සේව්‍ය සේවක දෙපාර්ශවය අතර සහයෝගීතාවය වර්ධනය කර ගැනීම තුළින් ආයතනයේ අරමුනු හා ඉලක්ක කරා ලගා කර ගැනීමටද කටයුතු කරන ලදී. එසේම, සියලුම ලේඛන භාෂා තුනෙන් මුද්‍රණය කර ප්‍රතිලාභීන්ට හා සේවකයින්ට පහසු වන අයුරින් ලබා දීමට කටයුතු කිරීමට හැකි වීමද මෙම වර්ෂයේදී ආයතනය ලැබූ ප්‍රගතියකි.

ඉහත අරමුණු සපුරා ගැනීමේදි මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අනෙකුත් නිලධාරීන්ගෙන්ද, සභාපතිතුමිය ඇතුළු භාරකාර මණ්ඩල සාමාජිකයින්ගෙන් ද කාර්ය මණ්ඩලයෙන් ද මා හට ලැබුනු නොමසුරු සහයෝගය මෙම අවස්ථාවේ කෘතඥ පූර්වකව සිහිපත් කරමි.



ඩබ්ලිව්. නිමල් අබේසිරි,
පාලන භාරකාර,
ලෝහෝර් ආර්යා ණය අරමුදල.

## දැක්ම

රාජ්‍ය අංශයේ සේවකයින්ට මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන
ප්‍රධානතම ආයතනය ලෙස ක්‍රියා කිරීම

## මෙහෙවර

රාජ්‍ය අංශයේ සේවකයින් ණය බරින්
මුදවා සතුටුදායක
රාජ්‍ය සේවයක් නගාසිටුවීමට දායක වීම

## අරමුණ

රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා හා පළාත් පාලන ආයතන වල
සේවයේ නිරත සේවකයින්ට සහනශීලි පොලී ප්‍රතිශතයක්
යටතේ පහසු කොන්දේසි මත කෙටිකාලීන ණය මුදල් කඩිනමින්
ලබා දීම මගින් ඔවුන් ණය බරින් මුදවා ගැනීම

## කාර්යභාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් ප්‍රතිලාභීන් සඳහා ණය ලබා දීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරිම.
- ණය කළමණාකරනය සඳහා යෝග්‍යවන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් වැඩි දියුණු කිරීම.
- අනෙකුත් රාජ්‍ය ආයතන වල සේවකයින්ට ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී පහසුකාරකයකු වශයෙන් කටයුතු කිරීම.

## 11.2013 වසරේ අරමුදලෙහි කාර්යසාධනය

### 1.1 2013 වසරේ ප්‍රතිලාභීන්

2013 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 5,005 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව වර්ගීකරණය කර ඇති දෙවන වගුවට අනුව 2012 වසරට සාපේක්ෂව 2013 වසරේදී දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණයවන අයුරින් ප්‍රතිලාභීන් විහිදී ගොස් ඇත. 2012 වසරේ ප්‍රතිලාභීන්ගෙන් 75% ක් පමණ කොළඹ දිස්ත්‍රික්කය අවට ආයතන වල සේවයේ නියුතු අය වුවද 2013 වසරේ එය අනෙකුත් සියලුම දිස්ත්‍රික්ක වල සේවකයින් අතර බෙදී ගොස් ඇත. වාර්ෂිකව පවත්වන ලද දැයට කිරුළ වැඩසටහනට සමගාමීව අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලැබූ විවිධ වැඩසටහන් වල දායකත්වය මේ සඳහා ලබා දී ඇත. එසේම ප්‍රතිලාභීන්ගෙන් 50% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව දෙවන වගුවෙන් නිරූපනය වේ.

**වගුව 01 – 2012 / 2013 වර්ෂවල ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව**

| දිස්ත්‍රික්කය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2012** | **(%)** | **2013** | **(%)** |
| කොළඹ | 3,245 | 74.45 | 711 | 14.20 |
| ගම්පහ | 288 | 6.60 | 677 | 13.52 |
| අනුරාධපුරය | 174 | 4.00 | 322 | 6.43 |
| මහනුවර | 143 | 3.28 | 303 | 6.05 |
| වව්නියාව | 77 | 1.78 | 25 | 0.50 |
| කළුතර | 64 | 1.47 | 416 | 8.32 |
| රත්නපුර | 59 | 1.35 | 172 | 3.43 |
| ගාල්ල | 55 | 1.25 | 287 | 5.73 |
| කුරුණෑගල | 46 | 1.10 | 428 | 8.55 |
| පුත්තලම | 44 | 1.00 | 53 | 1.06 |
| යාපනය | 43 | 1.00 | 02 | 0.04 |
| පොළොන්නරුව | 24 | 0.55 | 271 | 5.42 |
| ත්‍රිකුණාමලය | 20 | 0.46 | 211 | 4.22 |
| මුලතිව් | 15 | 0.34 | 04 | 0.08 |
| මන්නාරම | 10 | 0.23 | 08 | 0.16 |
| බදුල්ල | 10 | 0.23 | 145 | 2.90 |
| මාතලේ | 09 | 0.20 | 123 | 2.45 |
| හම්බන්තොට | 07 | 0.15 | 90 | 1.80 |
| කෑගල්ල | 06 | 0.14 | 191 | 3.82 |
| මඩකලපුව | 05 | 0.11 | 41 | 0.82 |
| අම්පාර | 05 | 0.11 | 228 | 4.55 |
| මොනරාගල | 04 | 0.10 | 122 | 2.44 |
| නුවරඑළිය | 03 | 0.06 | 66 | 1.33 |
| මාතර | 02 | 0.04 | 109 | 2.18 |
| **එකතුව** | **4,358** | **-** | **5,005** | **-** |

වගුව 02 - 2012 හා 2013 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

| තනතුර | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|
| | 2012 | 2013 |
| හමුදා සෙබල | 503 | 983 |
| පොලිස් කොස්තාපල් | 545 | 590 |
| පොලිස් සැරයන් | 389 | 216 |
| සාමාන්‍ය කම්කරු | 459 | 514 |
| කාර්යාල කාර්යය සහායක | 324 | 330 |
| කළමනාකරණ සහකාර | 329 | 375 |
| කෝප්‍රල් | 916 | 1207 |
| රියදුරු | 168 | 145 |
| පොලිස් පරීක්ෂක | 46 | 46 |
| උප පොලිස් පරීක්ෂක | 53 | 31 |
| අරක්කැමි | 41 | 57 |
| පොලිස් ආරක්ෂක සහායක | 16 | 11 |
| මැනුම් සහායක | 101 | 28 |
| බන්ධනාගාර නියාමක | 28 | 46 |
| භෝජනාගාර සේවක | 19 | 24 |
| සංවර්ධන සහකාර | 18 | 38 |
| උපස්ථායක | 20 | 04 |
| මුරකරු | 27 | 18 |
| මෝටර් කාර්මික | 10 | 02 |
| පොලිස් සිවිල් සහායක | 13 | 02 |
| කාර්මික ශිල්පි | 12 | 15 |
| වඩු කාර්මික නිලධාරී | 22 | 07 |
| සෞඛ්‍ය පරිපාලක | 08 | 05 |
| මේජර් | 23 | 18 |
| මානව සම්පත් සහකාර | 08 | 04 |
| ගිනිභටයන් | 08 | 02 |
| පරිපාලන නිලධාරී | 05 | 11 |
| පෙදරේරු | 12 | 09 |
| ගණකාධිකාරී | 11 | 09 |
| ලුතිනන් | 33 | 60 |
| ගබඩා සහායක | 6 | 07 |
| විදුලි කාර්මික | 13 | 07 |
| බයිසිකල් පනිවිඩකරු | 19 | 02 |
| ඕවර්සියර් | 08 | 02 |
| තැපැල් නිලධාරී | 30 | 13 |
| සහකාර අධ්‍යක්ෂක | 11 | 05 |
| පිළිගැනීමේ නිලධාරී | 02 | 02 |
| පොත් බැඳුම්කරු | 13 | 02 |
| ග්‍රාම නිලධාරී | 08 | 29 |
| වැඩසටහන් සහකාර | 16 | 31 |
| වෙනත් | 65 | 98 |
| **එකතුව** | **4358** | **5005** |

## 1.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රජය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම ආයතනයෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථිර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම හෝ විශ්‍රාම වැටුප් රහිත අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

- විශ්‍රාම ගන්නා වයස් සීමාවට පෙර ලබා දෙන ණය අයකර අවසන් කර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම.

- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.

- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථිර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.

- මෙම දෙපාර්ශවයේම, එනම් රාජ්‍ය අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්ගෙන් මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

ඉහත සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිළිබඳව 2013 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

**වගුව - 02 - ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය - 2013**

| මාසය | නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම්ලත් ණයලාභීන් සංඛ්‍යාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය වටිනාකම (රු. 000) |
|---|---|---|---|---|
| ජනවාරි | 605 | 293 | 354 | 13,680 |
| පෙබරවාරි | 700 | 318 | 305 | 11,845 |
| මාර්තු | 670 | 418 | 396 | 15,230 |
| අප්‍රේල් | 580 | 286 | 310 | 11,730 |
| මැයි | 847 | 371 | 370 | 14,245 |
| ජූනි | 816 | 392 | 527 | 20,555 |
| ජූලි | 1020 | 510 | 502 | 19,565 |
| අගෝස්තු | 840 | 497 | 536 | 20,650 |
| සැප්තැම්බර් | 822 | 486 | 440 | 17,060 |
| ඔක්තෝබර් | 874 | 512 | 490 | 19,235 |
| නොවැම්බර් | 872 | 514 | 406 | 15,805 |
| දෙසැම්බර් | 782 | 488 | 369 | 14,440 |
| **එකතුව** | **9,428** | **5,085** | **5,005** | **194,040** |

## 1.3 නිකුත් කල ණය සිමාවන් හා ණය මුදල් වටිනාකම

2013 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල උපරිම ණය සීමාවන්ට යටත්ව ලබා දුන් මුළු ණය වටිනාකම පහත පරිදි වේ. මෙහිදී රාජ්‍ය සේවකයින් 5,005 දෙනෙකුට රුපියල් මිලියන 194 ක ණය මුදලක් ලබා දී ඇත. මෙම වර්ෂයේ දී ලබාදුන් උපරිම ණය මුදල රු. 40,000/- ක් වු අතර 2012 ට සාපේක්ෂව සේවකයින් වැඩි පිරිසක් හට මෙම ණය මුදල ලබා දීමට හැකි වී ඇත. එහෙත් රු. 10,000/- ක් වන ඉතාම සුළු ණය මුදල ද හදිසි අවශ්‍යතාවයකදි සුළු සේවකයින් හට ලබා ගැනීමට හැකි වන අයුරින් අරමුදල විසින් තව දුරටත් පවත්වාගෙන යනු ලැබේ.

**වගුව 03 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය**

| උපරිම ණය සීමාව | නිකුත් කල ණය සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| 40,000 | 4,622 | 184.88 |
| 30,000 | 198 | 5.94 |
| 20,000 | 119 | 2.38 |
| 15,000 | 36 | 0.54 |
| 10,000 | 30 | 0.30 |
| **එකතුව** | **5,005** | **194.04** |

## 1.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය

2010 හා 2013 වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 5 වන වගුවෙන් හා 1 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වසරේ ණය අයකර ගැනීමේ ප්‍රගතිය 5.5% ක වර්ධනයක් පෙන්නුම් කෙරේ.

**වගුව 04 – 2010 සිට 2013 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම**

| වර්ෂය | ණය සංඛ්‍යාව | ණය නිකුත් කිරීම (රු. 000) | ණය අයකර ගැනීම (රු. 000) |
|---|---|---|---|
| 2010 | 5,943 | 170,065 | 211,855 |
| 2011 | 4,791 | 193,645 | 215,221 |
| 2012 | 4,358 | 173,970 | 228,064 |
| 2013 | 5,005 | 194,040 | 240,064 |

**ප්‍රස්තාරය - 01**



## 1.5 අක්‍රිය ණය ගිණුම් කළමණාකරණය

2011 හා 2013 වසර වල පැවැත් වූ පොදු ව්‍යාපාර කාරක සභා වල නිරීක්ෂණය වූයේ දශක ගණනාවක් තිස්සේ මෙම අරමුදල තුල අක්‍රිය ණය පැවත ඒමයි. එහිදි ලැබූ උපදෙස් පරිදි අක්‍රිය ණය අයකර ගැනීම සඳහා භාරකාර මණ්ඩලය විශේෂ විධිවිධාන සලසන ලදි. අක්‍රිය ණය අයකර ගැනීමේ ප්‍රගතිය විශේෂ කමිටුවක් විසින් දැඩි සුපරීක්ෂණයට භාජනය කරන ලදී. එසේම, සියලුම අක්‍රිය ණය අයකර අවසන් කිරීමටත් තවදුරටත් අයකර ගත නොහැකි ණය තිබේ නම් ඒ පිළිබඳව අවශ්‍ය නිතිමය පියවර ගැනීමටත් සැලසුම් සකස් කරන ලදී. එම සැලසුමට අනුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින්, අක්‍රියව පැවති ණය අය කර ගැනිමේ ක්‍රමවේද සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුලින් අක්‍රිය වී තිබූ ණය ගිණුම් වලින් 2012 හා 2013 වසරවල රුපියල් මිලියන 8 ක් අය කර ගැනීමට කටයුතු කරන ලදී.

**වගුව 05 - අක්‍රිය ණය අය කර ගැනිමේ ප්‍රගතිය 2012 – 2013**

| මාසය | අයකර ගැනිම (රු.) | |
|---|---|---|
| | **2012** | **2013** |
| ජනවාරි | 342,173 | 282,129 |
| පෙබරවාරි | 242,125 | 340,048 |
| මාර්තු | 226,216 | 254.035 |
| අප්‍රේල් | 200,558 | 277,117 |
| මැයි | 350,829 | 397,218 |
| ජූනි | 469.817 | 368,201 |
| ජූලි | 571,007 | 300,223 |
| අගෝස්තු | 377,813 | 415,693 |
| සැප්තැම්බර් | 235,859 | 298,129 |
| ඔක්තෝබර් | 437,927 | 230,941 |
| නොවැම්බර් | 337,417 | 314,079 |
| දෙසැම්බර් | 256,456 | 375,300 |
| **එකතුව** | **4,048,197** | **3,853,113** |

### 1.5.1 වර්ෂ 2005 දක්වා පැවති අක්‍රිය ණය ලිපිගොනු

එසේම, 2005 වර්ෂය දක්වා තවදුරටත් අක්‍රිය වී තිබූ ඉතා පැරණි ණය ලිපිගොනු 1,227 ක ණය ශේෂ අවසාන ගිණුම් තුල අන්තර්ගතව තිබීම පිළිබඳව අක්‍රිය ණය කමිටුව විසින් පරීක්ෂා කර පහත පරිදි කටයුතු කරන ලදී.

- දශක ගණනාවකට පෙර ලබා දුන් ණය මුදල් අයකර ගැනීමට විධිමත්ව ක්‍රියා නොකිරීම හේතුවෙන් වාර්ෂිකව පොලී ගණනය වීම මත අක්‍රිය වු දිනට තිබූ ණය ශේෂය පොලිය සමග ඉතා ඉහළ අගයක් සහිතව පරිගණක දත්ත වල ඇතුලත්ව ඇති බව නිරීක්ෂණය කිරීම.

- එම ගිණුම් අතුරින් ලබා දුන් ණය මුදලට වඩා වැඩියෙන් ණය වාරික ලැබී ඇති ගිණුම් 504 ක අක්‍රිය වු දිනට ණය ශේෂය රු. 1,546,089.27 ක් වුවද වරින් වර එම මුදල පියවීම හේතුවෙන් හා අක්‍රමික ගෙවීම් හේතුවෙන් එම ගිණුම් වල මුල් මුදල සම්පූර්යෙන්ම ආවරණය වී (පොලිය සමග) ලාභය (පොලීයෙන් 50% ට වඩා) ද ආයතනයට ලැබී ඇති එහෙත්, පරිගණක පද්ධතිය අනුව එම වටිනාකම රු. 16.226,259.43 ක් දක්වා වැඩි වී පරිගණක පද්ධතියේ පෙන්වන ලද ගිණුම් ශේෂ ඉවත් කිරීමට කටයුතු කිරීම.

- ප්‍රතිලාභීන් සේවය කරන ආයතන විසින් ණය වාරික වැඩිපුර කපා එවීමේ දුර්වලතාවය හේතුවෙන් ලෝහෝර් ආර්යා ණය අරමුදලට වැඩිපුර එකතු වූ මුදල් ඉදිරියේදී එසේ සිදු නොවීමට අවශ්‍ය පියවර ගනිමින් එහි හිමිකරුවන්ට නැවත ලබා දීමට කටයුතු කිරීම. එසේම 2013 වසරේ පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශය පරිදි මෙසේ එක්රැස් වූ ඉතාමත් පැරණි මෙතෙක් අයිතිකරුවන් ඉදිරිපත් නොවී තවදුරටත් ගිණුම් වල පැවති ශේෂය වන රු. 7,835,613/- ක මුදල අරමුදලේ ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කිරීම.
- අවිනිශ්චිත ගිණුම් ශේෂ - දිගු කාලයක සිට ආයතනයේ ගිණුම් තුල අවිනිශ්චිත ගිණුමක් පවත්වාගෙන ගොස් ඇති අතර මෙම ගිණුමේ කාල සීමාව සැලකිල්ලට ගෙන 2005 වර්ෂය දක්වා වූ එහි ශේෂය වන රු .1,240,113.23 ක මුදලද අරමුදලේ ආදායම් ගිණුමට පවරා ගැනීමට කටයුතු කිරීම. එසේම 2006 වසරේ සිට ඉදිරියට පවතින අවිනිශ්චිත ගිණුමේ ශේෂය තවදුරටත් ඉදිරියට ගෙන යාමට පියවර ගැනීම.

## 1.5.2 ආයතනයේ තව දුරටත් පවතින වගකීම්

### i ඇප බැඳුම්කර

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මකවී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දීමට අදාල ඇප බැඳුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් අදාල ණය මුදල් ගෙවී අවසන් බැවින් විධිමත් විගණන කමිටුවක නිර්දේශ මත ඇප ඔප්පු 142 ක් නීත්‍යානුකූල අයිතිකරුවන් වෙත භාර දීමට කටයුතු කරන ලදී. ඉන් ඔප්පු 4 ක් 2013.12.31 දින වන විට නිදහස් කිරීමට හැකිවී ඇත.

**වගුව - 06 අරමුදල සතුව පවතින ඇප ඔප්පු**

| විස්තරය | ඇප ඔප්පු සංඛ්‍යාව |
|---|---|
| මුළු ඇප ඔප්පු සංඛ්‍යාව | 267 |
| නිදහස් කිරීමට විධිමත් පරිදි කටයුතු කරන ලද ඔප්පු | 142 |
| තවදුරටත් සුරක්ෂිතව ඇති ඔප්පු (ලිපිගොනු සහ ලෙජර් සමග නොගැලපෙන) | 91 |
| අක්‍රීය ගිණුම් සහිත ඇප ඔප්පු | 30 |
| 2013 වසරේ අවසන් දින වන විට නිදහස් කර ඇති සංඛ්‍යාව | 4 |

### ii. ජීවිත රක්ෂණ බැඳුම්කර

ජීවිත රක්ෂණ බැඳුම්කර ඇපයට තබමින් වර්ෂ 1949 – 1987 කාල පරිච්ඡේදය තුල මෙම අරමුදලින් ණය මුදල් ලබා දී ඇත. මෙම ණය වර්ගයට අදාල ලිපිගොනු ලේඛනාගාරයේ පැරණි ලිපිගොනු අපහරණයේදී සොයා ගැනීමට හැකිවී ඇත. ඒ අනුව රක්ෂණ බැඳුම්කර 319 ක් නිදහස් කර ගැනීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ලිඛිතව දැන්වීමට ක්‍රියා කරන ලදී. එහෙත්, ඒවායේ කාල සීමාව ඉකුත් වීම හේතුවෙන් සහ රක්ෂණ සමාගම් වල අදාල ලේඛන ඉවත් කර තිබීම හේතුවෙන් අදාල කටයුතු කිරීම දුෂ්කර බව දන්වන ලදී. එබැවින් තවදුරටත් මෙම ලිපිගොනු ලේඛන ගත කොට ඇත. ඒ අනුව,

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු ගිණුම් - 216
- අනෙකුත් රක්ෂණ සමාගම් - 103

## 1.6 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

### 1.6.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ වර්ග අඩි 5500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සඳහන් ආයතන වලට කුලියට දි 2013 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 14.4 ක් උපයා ගන්නා ලදී.

**වගුව 07 – 2013 වසරේ ගොඩනැගිලි කුලී ආදායම**

| අනු අංක | ආයතනය | කුලියට සිටින මහල | වර්ග අඩි ප්‍රමාණය | ආදායම (රු.) |
|---|---|---|---|---|
| 01 | ලෝහෝර් ආර්යා ණය අරමුදල | 3 වන මහල | 5,500 | - |
| 02 | ලේක්හවුස් පොත්හල | බිම් මහල හා පතුල් මහල | 10,790 | 5,875,000 |
| 03 | සමූපකාර සේවක කොමිෂන් සභාව | 1 වන මහල | 2,415 | 1,753,590 |
| 04 | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | 1 වන මහල | 2,750 | 1,986,600 |
| 05 | ලංකා විදුලිබල මණ්ඩලය | 2 වන මහල | 4,700 | 3,776,548 |
| 06 | රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂම | 2 වන මහල | 840 | 840,000 |
| 07 | ඒ.ජේ.එස්. ඇසෝසියේටඩ් ආයතනය | අංක : 100/20 | 380 | 184,500 |
| | **එකතුව** | | **27,375** | **14,416,238** |

### 1.6.2 අරමුදලෙහි තිරසාරභාවය

අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් චිරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනිම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව අරමුදලේ අතිරික්ත මුදල් මහජන බැංකුවේ පහත අයුරින් ආයෝජනය කර ඇත.

**වගුව 08 - ආයෝජන**

| ආයෝජන වර්ගය | බැංකුව | 2012/12/31 දිනට (රු.) | 2013/12/31 දිනට (රු.) |
|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | මහජන බැංකුව | 751,871 | 71,842,646 |
| භාණ්ඩාගාර බිල්පත් | ,, | 7,200,900 | 12,416,639 |
| කෙටිකාලීන ආයෝජන **(REPO)** | ,, | 66,434,649 | 15,360,453 |
| **එකතුව** | | **74,387,420** | **99,619,738** |

### 1.6.3 මෙහෙයුම් ආදායම

2013 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 76.3 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 28.6 කි. 2012 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 7.1 ක වර්ධනයකි.

**ප්‍රස්තාර 02 - මෙහෙයුම් අතිරික්තය 2010 – 2013**




## 1.7 පහසුකාරකයෙකු (Facilitator) වූ ආයතන.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ පොල් සංවර්ධන අධිකාරියේ සේවකයින් සඳහා එම ආයතනයේ මුදල් භාවිතා කරමින් ණය ලබා දීමේ පහසුකම් සලසන්නෙකු ලෙස කටයුතු කරමින් සිටින අතර 2013 වර්ෂය තුලදී ද එම සේවාව යටතේ එම ආයතන වලට අයත් අරමුදල් භාවිතා කරමින් ලබා දුන් ණය ප්‍රමාණය පහත පරිදි වේ.

**වගුව 09 - ණය ලබා දීමේ පහසුකාරකයෙකු (Facilitator) වශයෙන් කටයුතු කිරීම**

| ආයතනය | ණය සංඛ්‍යාව | ලබා දුන් ණය වටිනාකම (රු.) |
|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 09 | 90,000 |
| පොල් සංවර්ධන අධිකාරිය | 25 | 1,230,000 |
| **එකතුව** | **34** | **1,320,000** |

## 1.8 දැයට කිරුළ වැඩ සටහන - 2013

රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව යමින් රටේ සංවර්ධන වැඩපිලිවෙලට මෙම අරමුදලද දායකත්වය ලබාදෙන ලදී. ඒ අනුව ජාතික සංවර්ධන වැඩපිලිවෙල සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කරන වාර්ෂික දැයට කිරුළ ප්‍රදර්ශණ වැඩසටහනට සමගාමීව මෙම අරමුදලේ ප්‍රතිලාභ සියලුම දිස්ත්‍රික්කවල රාජ්‍ය සේවකයින් සඳහා ලබා දීමේ අරමුණින් 2013 වසරේදී ද නැගෙනහිර පළාතේ පවත්වන ලද දැයට කිරුළ වැඩ සටහනේදී රාජ්‍ය සේවයේ නියුතු සේවකයන් 438 ක් සඳහා රු. මිලියන 17.27 ක ණය මුදලක් ප්‍රදානය කිරීමට ක්‍රියා කරන ලදී.

**වගුව 10 - දැයට කිරුළ පවත්වන ලද දිස්ත්‍රික්ක වල ණය ප්‍රතිලාභීන් සංඛ්‍යාව**

| දිස්ත්‍රික්කය | සේවක සංඛ්‍යාව | ණය මුදල් වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| පොළොන්නරුව | 94 | 3.71 |
| ත්‍රිකුණාමලය | 167 | 6.60 |
| අම්පාර | 120 | 4.70 |
| මඩකලපුව | 57 | 2.26 |
| **එකතුව** | **438** | **17.27** |

## 2. අරමුදලේ පසුබිම

මෙරට කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පූණ්‍ය කොමසාරිස්ව සිටි නැතනියල් දේවගැතිතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදි.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ ඒවා ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදුවී සිටියහ. මේ හේතුව නිසා රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනිමේදි ඉමහත් සහනයක් සැලසුනි.

1957 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.

### 2.1 භාරකාර මණ්ඩලය

භාරකාර මණ්ඩලය රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසකධූරය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් හොබවන අතර, භාරකාර මණ්ඩලය සඳහා සාමාජිකයින් පත්කිරීම ඔහු හෝ ඇය විසින් සිදුකරනු ලැබේ. අරමුදලෙහි පරිපාලනය සඳහා අවශ්‍ය වන භාරකාර මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පාලන භාරකරුවකු 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 3.2 වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

### 2.2 වගුව 11 – 2013 වසරේ ආයතනයේ කාර්යය මණ්ඩලය

| අනු අංකය | අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | ගණකාධිකාරී | 01 | 01 |
| 2 | පරිපාලන නිලධාරි | 01 | 01 |
| 3 | ගිණුම් නිලධාරි | 01 | 01 |
| 4 | අභ්‍යන්තර විගණන නිලධාරි | 01 | - |
| 5 | කළමනාකරණ සහකාර | 35 | 33 |
| 6 | රියදුරු | 02 | 02 |
| 7 | කාර්යාල කාර්ය සහායක | 05 | 05 |
| 8 | ගොඩනැගිලි නඩත්තු සහායක | 01 | 01 |
| | එකතුව | **47** | **44** |

## 2.3 සංවිධාන ව්‍යුහය



සභාපති ඇතුළු භාරකාර මණ්ඩලය
පාලන භාරකාර
ගණකාධිකාරී 01
ගිණුම් නිලධාරී 01
පරිපාලන නිලධාරී 01
විගණක නිලධාරී 01
කළමණාකරණ සහකාර 22
කළමණාකරන සහකාර 12
කළමණාකරන සහකාර 01
රියදුරු 02
ගොඩනැගිලි නඩත්තු සහායක 01
කාර්යාල කාර්ය සහායක 02
කාර්යාල කාර්ය සහායක 03

## 3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

### 3.1 නව බඳවා ගැනීම්

පුරප්පාඩුව පැවති පහත සඳහන් තනතුරු සඳහා නව නිළධාරීන් බඳවා ගන්නා ලදී.

- කළමණාකරණ සහකාර 111 ශ්‍රේණියේ තනතුරු 04
- රියදුරු තනතුරු 01
- කාර්යාල කාර්යය සහායක තනතුරු 01

### 3.2 උසස් වීම්

නිලධාරීන් 5 දෙනෙකු කළමණාකරන සහකාර 1 ශ්‍රේණියට ද, එක් නිලධාරියකු කණිෂ්ඨ කළමණාකරන 1 ශ්‍රේණියටද උසස් කරන ලදී.

### 3.3 කාර්ය මණ්ඩල සුහසාධනය / සුහද චාරිකාව

ආයතනයේ අරමුණු සහ ඉලක්කයන් සපුරා ගනිමින් උපරිම සේවාවක් සැලසීමට වර්ෂය පුරාම ඇප කැප වී සේවය කරන කාර්ය මණ්ඩලය තුල සුහදතාවය වර්ධනය කර ගැනීමට සහ විනෝදාශ්වාදයක් ලබා දෙමින් කාර්ය මණ්ඩලයේ ඵලදායිතාවය ඉහළ දැමීම පෙරදැරි කරගනිමින් 2013 වසරේ දෙසැම්බර් මස 14,15,16 යන දිනවල රංගිරි දඹුලු විහාරය, පොළොන්නරුව පූජා නගරය, පාසිකුඩා වෙරළ තීරය සහ කෝණේෂ්වරම් කෝවිල යන ස්ථාන නැරඹීම සඳහා චාරිකාව සංවිධානය කරන ලදී.

### 3.4 කාර්ය මණ්ඩල ණය

- 2011 වසරේ සිට කාර්ය මණ්ඩලය සඳහා රු. 100,000 කට යටත්ව ක්‍රියාත්මක කල ආපදා ණය මුදල , 2012 වසරේ ලබා නොගත් සේවකයින් 12 දෙනෙකුට ලබා දීමට කටයුතු කරන ලදී. එසේම මෙම ණය මුදල මාස 10 ක වැටුප හා පදනම්ව උපරිමය රු.250,000/-ට වැඩිකිරීමට ද සැලසුම් කරන ලදී.
- උත්සව අත්තිකාරම් රු.5,000/- සිට රු. 10,000/- දක්වා වැඩි කරන ලද අතර එය සියලුම සේවකයින්ට ලබා දිමට කටයුතු කරන ලදී.
- 2013 වසරේ සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් රු.5,000 ක් වටිනා තැගි වවුචර් පතක් සියලුම සේවකයින්ට ලබා දීමට කටයුතු කරන ලදී.
- රු. 6000/- බැගින් වු පාපැදි ණය සේවක ඉල්ලීම මත සේවකයන් 6 දෙනෙකුට ලබා දීමට කටයුතු කරන ලදී.

### 3.5 ආයතනයේ පරිගණක පද්ධතිය වැඩිදියුණු කිරීම

අමාත්‍යංශයේ නියෝජිතයින්ද ඇතුළු සාමාජිකයින් 4 දෙනකුගෙන් සමන්විත කමිටුවක් මගින් ඉදිරිපත් වූ ව්‍යාපෘති ඇගයීමකින් පසුව ලබා දුන් උපදෙස් පරිදි අරමුදලට වඩාත් උචිත මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කිරීමට පදනම් වන මෘදුකාංග අවශ්‍යතා පිරිවිතරයක් සකස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව එම කර්තව්‍ය මොරටුව විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන ඒකකයට භාරදුන් පසු අදියර කීපයක ක්‍රියාවලියකින් පසු පිරිවිතරය සකස් කිරීමේ කටයුතුද නිම කරන ලදී.

### 3.6 පාවිච්චි කල නොහැකි අබලි භාණ්ඩ අපහරණය

භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පාවිච්චි කල නොහැකිව භාවිතයෙන් ඉවත් කර ඇති අබලි ද්‍රව්‍ය (පුටු, මේස, කබඩ්, පරිගණක, විදුලි පංකා ආදිය) රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් විධිමත් කමිටුවක් මගින් මිල ගණන් තක්සේරු කොට රු.60,800 කට වෙන්දේසි කරන ලදී.

## 3.7 ලේඛනාගාරය නවීකරණය කිරීම.

ලේඛනාගාරයේ දශක ගණනාවකට අදාළ ලිපිගොනු අසුරා තිබූ බැවින් පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කර නවීකරණය කිරිමට කටයුතු කරන ලදී.

- යල් පැන ගිය ලිපිගොනු , ගිණුම් පියවී ඇති බවට විදිමත් විගණනයකින් තහවුරුකර ගැනිමෙන් පසු භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව අපහරණය කිරීම.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර කඩදාසි ටොන් 7.7 ක ප්‍රමාණයක් රු:30,796 කට වාලච්චේන කඩදාසි සංස්ථාව වෙත යැවීමට පියවර ගැනීම.
- ලේඛනාගාරය නවීකරණය කිරීම.
- තවදුරටත් සුරක්ෂිත කළ යුතු ලිපිගොනු සුරක්ෂිතව ගබඩා කිරීම . (අක්‍රීය ඇප හා රක්ෂණ)
- ණය ලිපිගොනු හඳුනාගැනීමට සහ පරිහරනයට පහසුවන පරිදි සංකේත ක්‍රමයක් හඳුන්වාදීම.

## 3.8 ගොඩනැගිලි පරිශ්‍රය වැඩි දියුණු කිරීම

ලෝහෝර් ආර්යා ණය අරමුදලට අයත් ගොඩනැගිල්ල කාලානුරූපීව නවීකරණය කලයුතුව ඇත. ඒ අනුව එම අඩුපාඩු පරික්ෂාකර අපද්‍රව්‍ය අපහරණ පද්ධතිය පිළිසකර කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවකු ලවා රුපියල් මිලියන 2.3 ක් වැය කරන ලදී.

## 3.9 විගණන හා කළමණාකරණ කමිටුව

